# රන් අස්වනු

## නව නිර්දේශිත බෝග ප්‍රභේද - 2015

2015 නොවැම්බර් මස 19 වන දින ගන්නොරුව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේදී පැවති නව බෝග ප්‍රභේද නිදහස් කිරීමේ කමිටු රැස්වීමේදී පහත සඳහන් නව ප්‍රභේද මෙරට වගාවන් සඳහා නිර්දේශ කරන ලදී.

### වී

**ප්‍රභේදයේ නම :** At 311




**ලක්ෂණ :**

- වයස - මාස 03.
- රතු බාස්මති කාණ්ඩයට අයත් විශේෂයකි.
- සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයට ටොන් 5.6 ක් වේ.
- ඇද වැටීමක් නැත. කරලක බොල් ප්‍රමාණය 7% ක් පමණ වන අතර අස්වනු නෙළීමේදී බීජ හැලීම 1% පමණ වේ.
- බත පිසීමේදී සහල් සහ ජලය සම පරිමාවට යෙදීමෙන් නොඇලෙන සුළු බතක් සපයයි. පිසූ බත ප්‍රසන්න සුවඳකින් යුක්තය.
- පෝෂණ ගුණයෙන් අනූනය. අඩු ග්ලයිසෙමික් අගයක් සහිතය.
- කොළ පාළුවට, බැක්ටීරියා අංගමාරයට, දුඹුරු පැළ කීඩෑ හානියට හා ගොක් මැස්සාට මධ්‍යස්ථව ප්‍රතිරෝධීය.
- දිවයිනේ ඕනෑම ප්‍රදේශයක වගාවට නිර්දේශ කර ඇත.

### රටකජු

**ප්‍රභේදයේ නම** : ANKG 2

**භාවිතා කරන නම** : ලංකා ජම්බෝ




**ලක්ෂණ :**

- සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයට මෙට්‍රික් ටොන් 2.5 - 3.0 ක් වේ.
- අස්වනු නෙළීම සඳහා දින 110 - 115 කාලයක් ගතවේ.
- බීජ 100 ක බර ග්‍රෑම් 75 - 78 වේ.
- කරලක අඩංගු බීජ ප්‍රමාණය දෙකකි.
- විශාල බීජ සහිත රට කජු ප්‍රභේදයක් වන මෙහි විශේෂත්වය වන්නේ මාස 3 1/2 ක පමණ කාලයක් තුළදී අස්වැන්න නෙලා ගැනීමට ඇති හැකියාවයි.

# මිරිස්

**ප්‍රභේදයේ නම :** MI Chili Hybrid 01



**ලක්ෂණ :**

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත ප්‍රථම දෙමුහුම් මිරිස් ප්‍රභේදය වේ.
- අමු මිරිස් සඳහා යෝග්‍ය ප්‍රභේදයකි.
- වියළි මිරිස් සඳහා ද යෝග්‍යය. නමුත් අමු මිරිස් හා වියළි මිරිස් අතර අනුපාතය 5:1 කි
- විභව අමු මිරිස් අස්වැන්න හෙක්ටයාරයට මෙට්‍රික් ටොන් 32 කි.
- සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයට මෙට්‍රික් ටොන් 25 කට වැඩිය.
- මිරිස් කොළ කොඩවීමේ සංකීර්ණයට හා පිපිඤ්ඤා විචිත්‍ර වෛරසය සඳහා මධ්‍යස්ථ ප්‍රතිරෝධී වේ.
- කරලක දිග සෙන්ටිමීටර් 10 - 13 ක් වන අතර පළල සෙන්ටිමීටර් 1.58 ක් වේ.
- මල් පිපීමට ගතවන කාලය දින 65 - 75 කි.
- සිටුවීම සඳහා යෝග්‍ය පරතරය සෙන්ටිමීටර් 60 X 45 කි.
- එක් වළක එක් පැළය බැගින් සිටුවීම යෝග්‍යය.

# කරවිල

**ප්‍රභේදයේ නම :** ගන්නෝරුව හයිබ්‍රිඩ් බිටර් ගෝඩ් M15

**භාවිතා කරන නම :** නිරෝගා



**ලක්ෂණ :**

- ආකර්ශනිය පෙනුමක් ඇති දෙමුහුම් ප්‍රභේදයකි.
- පිටත ආවරණය ලා කොළ පැහැතිය.
- දිළිසෙන සුළු මතුපිටක් ඇත.
- කටු රහිත සුමට දාර සහිත බැවින් ඇසිරීමට හා ප්‍රවාහනයට පහසුය.
- ආනයනික කරවිල ප්‍රභේද හා තරඟකාරී අස්වැන්නක් ලබා දේ.
- සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයට මෙට්‍රික් ටොන් 15 - 20 පමණ වේ.
- කරලක බර ග්‍රෑම් 200 - ග්‍රෑම් 250 අතර වේ.

# මාලු මිරිස්

**ප්‍රභේදයේ නම :** ගන්නොරුව හයිබ්‍රිඩ්

කැප්සිකම් 1

**භාවිතා කරන නම :** ගන්නොරුව ප්‍රාර්ථනා




**ලක්ෂණ :**

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රථමයෙන්ම නිර්දේශ කල දෙමුහුම් මාළු මිරිස් ප්‍රභේදයයි.
- හෙක්ටයාරයකට ටොන් 21 ට වැඩි අස්වැන්නක් ලැබේ.
- කරලක බර ග්‍රෑම් 37 කි.
- දිලිසෙන සුළු කොළ පැහැයක් ගනී.
- සැර ගතිය වැඩිය.
- බැක්ටීරියානු හිටු මැරීමේ රෝගයට මධ්‍යස්ථ ලෙස ප්‍රතිරෝධී වේ.
- වෙළෙඳපොල ඉල්ලුමක් ඇති දික් ත්‍රිකෝණාකාර හැඩයක් ගනී.

# මෑ

**ප්‍රභේදයේ නම :** ගන්නෝරුව මස්ක් මෑ

**භාවිතා කරන නම :** ගන්නොරුව A9 මෑ





**ලක්ෂණ :**

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිකුත් කරන ලද ප්‍රථම දෙමුහුම් මෑ ප්‍රභේදයයි.
- හෙක්ටයාරයකට ටොන් 21 - 24 කට වැඩි අස්වැන්නක් ලබාදෙන මෙම නව ප්‍රභේදයෙන් දින 59 දී පමණ පළමු අස්වැන්න නෙලිය හැකිය.
- දිගු, මාංශල, කොළ පැහැති කරලෙහි සාමාන්‍ය දිග සෙන්ටිමීටර් 64 ක් හා බර ග්‍රෑම් 30 ක් වන අතර බීජ දුඹුරු පැල්ලමක් සහිත කළු පැහැ වේ.
- ගෙල කුණුවීමේ රෝගයට ක්ෂේත්‍රයේදී ප්‍රතිරෝධීතාවයක් දක්වන පළමු ප්‍රභේදයයි
- රසයෙන් වැඩි අතර, දිගු කාලයක් කල් තබාගත හැක.
- එක් දේශගුණික කලාපයකට සීමා නොවී ලංකාව පුරාම වගා කළ හැකිය.

# තුඹ කරවිල

**ප්‍රභේදයේ නම :** ANKTHF1

**භාවිතා කරන නම :** චන්දු



**ලක්ෂණ :**

- විහව අස්වැන්න හෙක්ටයාරයට මෙට්‍රික් ටොන් 28 ක් වන අතර ජායාංගී (ගැහැණු) වැලකි.
- ගෙඩියේ පැහැය තද කොළ පැහැතිය. හැඩය ඕවලාකාරය. ගෙඩියක සාමාන්‍යය බර ග්‍රෑම් 40 - 45 ක් පමණ වේ.
- පත්‍ර තද කොල පැහැතිය. පහළ පත්‍ර කොටස් 5 කට බෙදී ඇත.
- අවුරුද්දේ ඕනෑම කාලයක වගාව ආරම්භ කල හැකිය.
- සති 3 කින් මල් හටගනී.
- කෘතිම පරාගනය උදෑසන 9.00 ට කලින් සිදු කළ යුතුය.
- මල පිපී දින 12 - 15 අතර ඵලය නෙලීමට සුදුසු වේ.
- සතියකට දෙවාරයක් අස්වනු නෙලීම කළ යුතුය
- වගාව මාස 6 සිට අවුරුද්දකට වැඩි කාලයක් ජල සම්පාදනය හා නිසි බෝග වගා කළමණාකරන තත්ත්ව යටතේ පවත්වාගෙන යා හැකිය.
- කාබනික පොහොර වලට ප්‍රතිචාරය වැඩියි.
- කාබනික පොහොර හා මතුපිට පස් 1 : 1 මිශ්‍රණයෙන් වල පුරවා එයට දහයියා අඟුරු කිලෝ ග්‍රෑම් 1 ක් පමණ කලවම් කිරීමෙන් සාර්ථක අස්වැන්නක් ලැබේ.
- අතු වලින් ලබා ගන්නා පැළ සිටුවීම පහසු ක්‍රමය වේ.

**ප්‍රභේදයේ නම :** ANKTHM1

**භාවිතා කරන නම :** විජය



**ලක්ෂණ :**

- පුමාංගී (පිරිමි) වැලකි.
- පත්‍ර තද කොල පැහැතිය. පහළ පත්‍ර පැහැදිලිව බෙදී ඇත.
- මල් කහ පැහැතියි, විශාලයි.
- මහි පත්‍ර කළු පැහැතියි.
- හොඳින් වැඩුණු වැලක දිනකට මල් 50 කට වැඩි ප්‍රමාණයක් හටගනී.
- පරාග තද තැඹිලි පැහැයක් ගනී.
- අවුරුද්දකට වැඩි කාලයක් වැල් නඩත්තු කළ හැකිය.

# දූරියන්

**භාවිතා කරන ප්‍රභේද නම :** ගන්නොරුව ස්වීට්

 

**ලක්ෂණ :**

- ගෙඩියක සාමාන්‍ය බර කිලෝ ග්‍රෑම් 2 - 4.5 ක් වේ.
- මදයේ වර්ණය කහ පැහැයට හුරු තැඹිලි පැහැතිය.
- මදය පැණි රසයි, බ්‍රික්ස් අගය 28 කි.
- මදයේ ඝණකම වැඩියි සෙන්ටිමීටර් 1.5 - 1.9 ත් අතර ඝණකමිය.
- කෙඳි හා පිෂ්ඨ ස්වභාවයෙන් යුක්තය.
- බීජයේ විශාලත්වය තරමක් අඩුය, බීජයක බර ග්‍රෑම් 120 පමණ වේ. ගෙඩියක ඇති පුහු ඇට ප්‍රමාණය වැඩිය.
- ගෙඩිය පහසුවෙන් පලා මද ඉවත් කර ගැනීමට හැකිය. මදයේ ඝණ බව නිසා මදුලු වල හැඩය වෙනස් වීමකින් තොරව ඉවත්කර ගත හැකිය.
- බද්ධ පැළ සිටුවා අවුරුදු 6 - 7 කින් පිදෙන අතර අවුරුදු 10 වයස ගසකින් ගෙඩි 20 - 25 ක් පමණ හටගනී.

# උගුරැස්ස

**භාවිතා කරන ප්‍රභේද නම :** ගන්නොරුව උගුරැස්ස

 

**ලක්ෂණ :**

- ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 14 ක් පමණ වේ.
- ගෙඩියක විශ්කම්භය සෙන්ටිමීටර් 2.8 පමණ වේ.
- ඉදුණු ගෙඩි වල පොත්ත දම් පාටය, මදය කහ තැඹිලි පාටය.
- ඉදුණු ගෙඩි පැණි රසය. බ්‍රික්ස් අගය 15 - 22 අතර වේ.
- අවුරුදු 7 වයස ගසක ගෙඩි කිලෝග්‍රෑම් 25 - 30 පමණ හටගනී.
- ගෙඩියක බීජ 5 - 8 ඇති අතර බොල් ඇට 2 - 5 පමණ පිහිටයි.
- බද්ධ පැළයක් සිටුවා අවුරුදු 3-4 කින් ගෙඩි හට ගැනීම.
- කඳෙහි කටු නොපිහිටයි.

# බිම්මල්

**ප්‍රභේදයේ නම :** මාකඳුර වයිට්

**ලක්ෂණ :**

- වගා මාධ්‍ය පිදුරු හෝ ලී කුඩු.

- දළිර සූත්‍රිකා වර්ධන කාලය (බීජෝෂණ කාලය) පිදුරු මාධ්‍ය දින 20 - 25 ක් හා කුඩු මාධ්‍ය දින 25 - 30 ක් වේ.
- බිම්මලේ පැහැය - සුදු පැහැතිය.



- අඟල් 4 - 6 පමණ දිගැති නටුවකින් හා අඟල් 2 - 4 විෂ්කම්භයකින් යුත් කැප් (CAP) එකකින් සමන්විතය.
- බිම් මලක සාමාන්‍ය බර ග්‍රෑම් 100 - 125
- අස්වැන්න ග්‍රෑම් 650-750 (මාස 2 ක කාලයක් තුළදී).
- කල් තබා ගැනිම.
  ශිතකරණයක දින 10 - 12 ක්.
  විවෘත පරිසරයේ දින 04 - 05 ක්.
- අවම පළිබෝධ හානිය.
- රසයෙන් අනූනය, ඉහළ පෝෂණ අගයක් ඇත
- අධික සීතල ප්‍රදේශ හැර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක වගා කළ හැකිය.
- වෙනත් වාණිජව වගා කරන බිම් මල් වලට සාපේක්ෂව අධික ලාභයක් ඇත.

## අවශ්‍යතාවය මත බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා නිදහස් කරන ලද ප්‍රභේද

(Conditional Release)

පහත නිදහස් කරන ලද ප්‍රභේද යම් යම් විශේෂිත ප්‍රභේදාත්මක ලක්‍ෂණ මත පදනම්ව අවශ්‍යතාවය මත බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා නිදහස් කරන ලදී. නමුත් පවතින්නා වූ යම් යම් අඩුපාඩු සකස් කර නැවත ප්‍රභේද නිර්දේශ කිරීම සඳහා ඉදිරිපත් කළ යුතුව ඇත.

## පොප්කෝර්න්

**ප්‍රභේදයේ නම** - MI පොප්කෝන්

(MI Popcorn)





**ලක්‍ෂණ :**

- විවෘත පරාගිත ප්‍රභේදයක් වේ.
- විභව අස්වැන්න - හෙක්ටයාරයට මෙට්‍රික් ටොන් 2- 2.5 කි.
- කරලක දිග - සෙ.මී 18 -20 කි. බොහෝ විට ගසක සරු කරල් දෙකක් හටගනී.
- මල් පිපීමට ගතවන කාලය - පිරිමි මල දින 42 - 43 ගැහැණු මල දින 45 - 46.
- සිටුවීම සඳහා යෝග්‍ය පරතරය - සෙ.මී. 60 x 30 එක් ස්ථානයක පැළ 2 ක් බැගින්.

# මොර

**ප්‍රභේදයේ නම :** ගන්නොරුව මොර 1

**භාවිතා කරන නම :** නිරෝධා




**ලක්ෂණ :**

- දේශීය ඇට මොර වලට වඩා මාංශලය හා යුෂ සහිත ආවේණික සුවඳින් යුතු ඉතා රසවත් ප්‍රභේදයකි.
- දේශීය මොර බීජ පැළ වලට බද්ධ කොට සාර්ථකව පැළ නිෂ්පාදනය කරගත හැකිය.
- එලෙස සකස් කරගත් බද්ධ පැළයක් සිටුවා වසර 2 - 3 කින් ඵල දරණු ලැබේ.
- වසර 3 - 4 කදී ගසකින් ඵල 1800 ක පමණ අස්වැන්නක් ලබාගත හැකිය.
- බඳුන් වගාවට ද සාර්ථකව භාවිතා කළ හැකිය.

# මසං/දෙබර

**ප්‍රභේදයේ නම :** ගන්නොරුව මසං 1 (ඉබ්බාගමුව)




**ලක්ෂණ :**

- දේශීය මසං වලට වඩා විශාල ඵල දරයි
- ඵලයක සාමාන්‍ය බර ග්‍රෑම් 60 - 85 ක් පමණ වේ
- ලා කොළ පැහැති ඇපල් ගෙඩියකට සමාන ආකර්ෂණීය පලතුරකි.
- මාංශලය ඇපල් හෝ පෙයාර්ස් වල රසවත්භාවයට බොහෝදුරට සමානය.දේශීය මසං බීජ පැළ වලට පහසුවෙන් බද්ධ කොට පැළ නිපදවා ගත හැකිය.
- බද්ධ පැළයක් සිටුවා වසර 2 - 3 කින් පමණ හොඳ අස්වැන්නක් ලබාදෙයි. සාමාන්‍යයෙන් වසරකට කිලෝ ග්‍රෑම් 50 - 200 ක පමණ වේ.
- බඳුන් වගාවට ද සාර්ථකව භාවිතා කල හැකිය.

**ප්‍රභේදයේ නම :** ගන්නොරුව මසං 2 (අරලගන්විල)



**ලක්ෂණ :**

- දේශීය මසං වලට වඩා ඉහළ ගුණාත්මයෙන් යුතු ඵලයක සාමාන්‍ය බර ග්‍රෑම් 10-16 ක් පමණ වන ප්‍රභේදයකි.
- වියළි කලාපයේ සහ තෙත් කලාපයේ හොඳින් වගාකල හැකිය.

- ඉතා කුඩා ඇපල් ගෙඩියකට සමාන හැඩයෙන් යුතු ඵල ලා කොළ පැහැති වන අතර හොඳින් පැසෙනවිට ලා කොළ කහ පැහැයට හැරෙයි.
- දේශිය මසං බීජ පැළ වලට බද්ධ කොට සාර්ථකව පැල නිෂ්පාදනය කරගත හැකිය.
- බඳුන් වගාවට ද ඉතා සුදුසුය.
- සිටුවා මාස 6 - 8 කින් පමණ ඵල දැරීම ආරම්භ වුව ද හොඳින් ඵල දැරීමට වසර 3 - 4 ක් ගතවේ.

# කරවල කැබිල්ල

**ප්‍රභේදයේ නම :** රෙඩ් බන්ච්





**ලක්ෂණ :**

- වැඩි දියුණු කළ උසස් ගුණාංග සහිත කැබිල්ල ප්‍රභේදයකි.
- ඉදුණු විට තද රතු දම් පැහැති කුඩා ගෙඩි සහිත පොකුරු වශයෙන් ඵල දරණ ආකර්ෂණීය රසවත් පලතුරු ශාකයකි.
- මේවා ඇඹුල් මිශ්‍ර පැණි රසැතිය.
- පලතුරු බීම ආදි නිෂ්පාදන සඳහා භාවිතා කළ හැකිය.

- හොඳින් වැඩුණු ශාකයකින් වසරකට කිලෝ ග්‍රෑම් 200 - 300 ක් පමණ අස්වැන්නක් ලබාගත හැකිය
- බඳුන් වගාවට ද සුදුසුය.


තොරතුරු :
**ආචාර්ය අමිතා බෙන්තොට,**
ලේකම් - බෝග ප්‍රභේද නිදහස් කිරීමේ කමිටුව,
අධ්‍යක්ෂ - වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය බතලගොඩ

රන් අස්වනු ගොවිකම් සඟරාවට ගෙන ආවේ,
**නිලූෂි ද සිල්වා,**
කෘෂිකර්ම උපදේශක,
තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව


---



**සබ්බදානං ධම්මදානං ජිනාති**
**සබ්බ රසං ධම්මරසෝ ජිනාති**
**සබ්බ රතිං ධම්මරතී ජිනාති**
**තණ්හක්ඛයෝ සබ්බදුක්ඛං ජිනාති**

ධර්ම දානය
සියළු දානයන් පරදවා දිනයි.
ධර්ම රසය
සියළු රසයන් පරදවා දිනයි.
ධර්ම ශ්‍රවණය කිරීමෙන් ඇතිවන ප්‍රීතිය
අන් සියළු ප්‍රීතිය පරදවා දිනයි.
රහත්ඵලය සියළු දුක් පරදවා දිනයි

- ධම්ම පදය -